18 වන පිටෙන්

2001 සැප්තැම්බර් 11 වැනි දින අල්කයිඩා සංවිධානය විසින් ඇමෙරිකාවේ පෙන්ටගනයට හා ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයට පහරදීමත් සමග ජාත්‍යන්තර වශයෙන් ත්‍රස්තවාදී සංවිධාන මැඩ පැවැත්වීමට පටන් ගත් අවස්ථාවේ කොටි සංවිධානය ශ්‍රී ලංකා රජය සමග සටන් විරාමයකට පෙළඹුනෙත් උපක්‍රමයක් ලෙසය. මේ වන විට ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ ඝාතනය හරහා එල්ල විය හැකි ජාත්‍යන්තර විරෝදයට මුහුණ පෑමට සූදානමෙන් කොටි යළිත් සාකච්ඡා මේසයට එන වග පෙන්වා දී ඇත.

ඔවුන් සටන් විරාම ගිවිසුම නැවත විමර්ශනයට ලක් කිරිම, ගිවිසුම වඩාත් ශක්තිමත් කිරිම යන කාරණා ඉදිරිපත් කර තිබේ.

එහෙත් මෙහිදි විමර්ශණය කළ යුත්තේ සටන් විරාමය තවදුරටත් සංශෝධනය් කරනවාද? නැතිනම් කොටින්ට හරියන අකාරයට එකක් සකස් කරනවාද යන්නය. දැනට ඇති ගිවිසුම කොටින්ට වාසිදායක ලෙස සකස් කරගත් එකක් මිස සාමයක් සඳහා යන ගමනකට සකස් කළ එකක් නොවේ. ඒ තරමටම කොටි සංවිධානය සටන් විරාමයෙන් වැඩ අරගෙන හමාරය. කොන්දේසි ගණනාවක් ඉදිරිපත් කරමින් එ.ජා.ප. රජය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් තැබූ කොටි සංවිධානය මේ වනවිට 5970 වතාවක් සටන්විරාමය උල්ලංඝණය කර ඇතැයි ආරක්ෂක අංශ සටන් විරාම නිරික්ෂණ කමිටුවට පැමිණිලි කර ඇත. එයින් 3362 වතාවක් පැහැදිලිවම සටන් විරාමය උල්ලංඝණය කර ඇතැයි සටන් විරාම නිරික්ෂකයින් තීන්දු කර ඇත. මෙම කාලය තුළ ළමයින් 198 ක් ඇතුලූ 1110 දෙනකු පැහැරගෙන තිබේ. බලහත්කාරයෙන් 1971 ක් ගෙන ගොස් ඇත. බුද්ධි නිලධාරින් ඇතුලූ ආරක්ෂක අංශවල 54 දෙනෙකු ඝාතනය කර හමාරය. මේ අතරට යාපනයේ පොලිස් අධිකාරි චාල්ස් විජේවර්ධන, පළමු වන සන්නද්ධ බුද්ධි බලකායේ අණදෙන නිලධාරි ලූතිනන් කරනල් තුවාන් නිසාම් මුතාලිෆ්, දෙහිවල පොලීසියේ බුද්ධි අංශ ස්ථානාධිපති සුනිල් තාබෲ යන නිලධාරින්ගේ නම් ද අයත්ය. සටන් විරාම කාලය තුළ ඔත්තුකරුවන් 33 ක්, කොටිවිරෝධී දේශපාලන පක්ෂ සාමාජිකයන් 51 ක් ඇතුලූව සාමාන්‍ය වැසියන් 227 ක් ඝාතනය කර හමාරය. එම කාලය තුළ රුපියල් හාරසිය පනස් පන්කෝටි එකසිය අසූනව ලක්ෂ හයදාස් අටසිය හතළිස් දෙකක් (මෙය ආරක්ෂක අංශවලට ලද තොරතුරු පමණි) කප්පම් වශයෙන් ලබාගෙන ඇත.
මෙම කාලසීමාව තුළ කොටි සංවිධානය විසින් ආරක්ෂක අංශවලට එරෙහිව පැමිණිලි 1122 ක් ඉදිරිපත් කර ඇත. එයින් සටන් විරාමය උල්ලංඝණය වූ අවස්ථා ලෙස සලකා ඇත්තේ සිද්ධීන් 133 කදී පමණි. මෙම තොරතුරු සැලකීමේදී කොටි සටන් විරාමය ක්‍රියාත්මක කර ඇත්තේ කුමන දේයකටද යන්න මනාව පැහැදිලිවේ. සටන්විරාමයට මුවාවී තවදුරටත් කොටින්ට ශක්තිමත් වීමට ඉඩ දෙනවාද යන්න තීන්දු කළ යුතු කාලය උද්ගත වී ඇත.
සටන් විරාම ගිවිසුම සම්බන්ධ පැමිණිලිවලින් තමන්ට අවාසියක් වෙතැයි බියෙන් ආරක්ෂක අංශවලට එරෙහිව විවිධ පැමිණිලි ඉදිරිපත් කරමින් පැමිණිලි සංඛ්‍යාව වැඩිකිරිමේ කොටි සැළසුමක්ද මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී. ඔවුන්ගේ පැහැදිලි අරමුණ වී ඇත්තේ තමන්ට එරෙහිව කර ඇති පැමිණිලි ගණනට සමාන ගණනක් ආරක්ෂක අංශවලට එරෙහිව ඉදිරිපත් කිරිමය.

කෙසේ වෙතත් ආරක්ෂක අංශ පවසන්නේ සටන් විරාම නිරික්ෂණ කමිටුවට කරන පැමිණිලිවලටම සිමාවන වගකි.  එතැනින් එහා කිසිඳු බලපෑමක් එල්ල කිරීමට සටන් විරාම නිරීක්ෂකයන්ද අපොහොසත්ය. මේ අනුව නෝර්වේ නිරීක්ෂකයන්ට පැමිණිලි කිරීමට වැය කරන කාලය මෙන්ම කඩදාසි පවා අපතේ යන බව ආරක්ෂක අංශ පෙන්-වා දෙයි.
කදිරගාමර් මහතාගේ ඝතනය වසන් කිරීමට යළි සාකච්ඡාවකට පැමිණෙන බවට කොටි පුරසාරම් දෙඩුවද මෙම මාසයේ ඇරඹෙත්ම යළි විවිධ කොන්දේසි පනවන්න පටන්ගෙන ඇත. ඒ යළිත් සාකච්ඡා මේසයෙන් පිටපැනීමේ අරමුණින් විය හැක.

මෙම සාකච්ඡා ශ්‍රී ලංකාවේ පැවැත්වීමට රජය අදහස් කළද කොටින්ට ඊට එරෙහිවද හඬක් නගමින් සිටියි. ඉදිරි දින කිහිපය ඇතුළත කොටි සංවිධානය විසින් කරුණා පිල නිරායුධකරලීම සඳහාද රජයට කො-න්දේසියක් පැනවීමට සුදානමින් සිටියි. ඒ කරුණා පිලේ තර්ජනයට මුහුණදීමට තවමත් කොටි සංවිධානයට ඇති නොහැකියාව නිසාය. තැනින් තැන කොටින්ට එල්ල වන ප්‍රහාර දරාගත නොහැකි නිසාය.

මීළඟ ජනාධිපතිවරනයේදි උතුරු නැගෙනහිර හොර ඡන්ද කොල්ලයකට යෑමට සූදානමින් සිටින කොටි සංවිධානය නැගෙනහිර කරුණාගේ බලය අවම කර ගැනීමට සූදානමින් සිටින බවද බුද්ධි අංශ අනාවරණය කර ඇත. ඒ තමන්ට නැගෙනහිර පළාතේ ඡන්ද කොල්ලකෑමකට කරුණා පිලෙන් අවස්ථාවක් නොලැබෙතැයි ඇති සැකය නිසාය.
පසුගිය 2003 වසරේ පැවැති මහ මැතිවරණයේදී උතුරු නැගෙනහිර ඡන්ද කොල්ල කා දෙමළ සන්ධාන මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට යැවූ ආකාරයට මෙවරද උතුරු නැගෙනහිර හොර ඡන්ද දමා තමන්ට අවශ්‍ය ආකාරයට ඡන්ද බලය ලබා ගැනීමට කොටි සැලසුම් කර ඇත.

ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ ඝතනයත් සමග පැනවූ හදිසි නීතිය තම කාර්යයට හරස්වේ යැයි බියෙන් කොටි සංවිධානය ලහි ලහියේම හදිසි නීති ඉවත් කිරීමට සැලසුම් කරමින් සිටියි. ඒ සඳහා අවශ්‍ය සියලු කටයුතු දැනටමත් දෙමළ සන්ධානය වෙත පවරා ඇත.

හදිසි නීතිය පැවතියහොත් මීළඟ ජනාධිපතිවරණයේදී තමන්ට හොර ඡන්ද දැමීමට ඉඩක් නොලැබෙන බවද කොටි තම අනුගාමිකයන්ට පෙන්වා දී තිබේ

ඒ අනුව හදිසි නීතිය ඉවත් කරවාගෙන මීළඟ ජනාධිපතිවරණයේදී තමන්ට වාසි දායක තත්ත්වයක් ගොඩනංවා ගැනීමට කොටි අර අදිමින් සිටින බව බුද්ධි අංශ අනතුරු අඟවා ඇත.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිධූරයට පත්වුවහොත් තමන්ට අවශ්‍ය කාර්යයන් ඉටු නොවන බව දන්නා කොටි සංවිධානය ජනාධිපතිවරණයට දින කිහිපයකට හෝ මහින්ද රාජපක්ෂ මහතා ඝාතනය කිරීමට අර අදින බවට බුද්ධි අංශ අනතුරු අඟවා ඇත. එවැනි දෙයක් හරහා එම පක්ෂයට හදිසියේ වෙනත් අපේක්ෂකයකු පත් කරවා ගත නොහැකි තත්ත්වයක් උදාකර තමන්ට එරෙහි බලවේග මැඩපැවැත්වීම කොටින්ගේ අරමුණ බව පැහැදිලිය.
මේ සියලු අභියොග වලට ඉදිරියේදි රජයට මුහුන දීමට සිදුවනු ඇත. ■

SM WILSON
& ASSOCIATES
Public Accountant    Registered Tax Agent

STEPHEN M. WILSON
B.Bus. Acc.  PNA, FITA

*Proudly Supports the Sri Lankan Community*

Shop 4, 92 Railway Street South (PO Box 187)  Altona Victoria 3018
Telephone : (03) 9398 1900  Facsimile : (03) 9398 6280